(9)

# අභ්‍යන්තර සටහන

## ශික්ෂණ රෝහල - බදුල්ල

| | |
|---|---|
| දිනය | 2023.11. 02 |
| වෙත | සියලුම විශේෂඥ වෛද්‍යවරුන් / සියලුම වෛද්‍යවරුන්.<br>සියලුම ඒකක/ අංශ ප්‍රධානීන් |
| වෙතින් | අධ්‍යක්ෂ |
| පිටපත් | 1) තොරතුරු තාක්ෂණ නිලධාරී - වෙන් කිරීම් පිළිබඳව රෝහල් වෙබ් අඩවියෙහි යාවත්කාලීනව ඇතුලත් කිරීමට<br>2) හෙද සොයුරු, ලේ බැංකුව<br>3) අධ්‍යක්ෂ කාර්යලයෙ සෞ.කා. සහයකයින් හා ශ්‍රවනාගාර භාර සෞ.කා. සහයකයින් - වෙන් කිරීම් පිළිබඳව තොරතුරු තාක්ෂණ නිලධාරී සංජීව මයා වෙත වහාම දැනුම් දීමට |
| විෂයය | රෝහල සතු ශ්‍රවනාගර වැඩ සටහන සඳහා වෙන් කර ගැනීම |
| ගොණු අංකය | BD/GH/CPHMA/1/2013 |

වැඩමුළු ඇතුලු විවිධ ක්‍රියාකරකම් සඳහා රෝහලෙහි ඇති ශ්‍රවනාගාර වෙන්කරවා ගැනීමට හඳුන්වා දී ඇති අයදුම්පත මගින් කල්වේලා ඇතිව අනුමැතිය ලබාගත යුතු වුව ද එම ක්‍රමවේදයට අනුව කටයුතු නොකර අක්‍රමවත්ව ශ්‍රවනාගාර භාවිතයට ලබා ගැනීමට මෑත කාලීනව කටයුතු කිරීම නිසා අත්‍යවශ්‍ය හා ප්‍රමුඛත්වය ලබා දිය යුතු වැඩමුළු කිහිපයක් සඳහා ශ්‍රවනාගාර ලබා දීමේ දී ගැටලු මතුවිය.

විශාල වටිනාකමක් සහිත තොරතුරු ඉලෙක්ට්‍රොනික උපකරණ හා භාණ්ඩ වලින් සමන්විත මෙම ශ්‍රවනාගාර විධිමත් අනුමැතියකින් තොරව භාවිතයට ලබා දිය නොහැකි බව අවධාරණය කරන අතර මින් ඉදිරියට සියලුම වැඩ සටහන් සඳහා, හඳුන්වා දී ඇති අයදුම්පත මගින් ශ්‍රවනාගාරයක් වෙන්කර ගැනීම අනිවාර්ය බව දන්වා සිටිමි.

අංශ ප්‍රධානීන්ගේ රැස්වීම්, සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් දැනුවත් කර සිදු කරනු ලබන රැස්වීම්, අධ්‍යක්ෂ විසින් කැඳවනු ලබන වෙනත් රැස්වීම් මෙන්ම සහභාගීත්වය 40කට වැඩි සංඛ්‍යාවක් වන වැඩමුළු, සම්මන්ත්‍රණ පුහුණු වැඩසටහන් සඳහා නව ශ්‍රවනාගාරය ලබා දේ. (70)

අනෙකුත් අවශ්‍යතා සඳහා පැරණි ශ්‍රවනාගාරය මෙන්ම අවශ්‍යතාවය පරිදි ලේ බැංකු ශ්‍රවනාගාරය ද වෙන්කර දිය හැක. එකම දිනයක පැවැත්වෙන වැඩ සටහන් කිහිපයක් සඳහා ඉල්ලීම් ලැබේ නම් අවශ්‍යතාවය අනුව පූර්ව අනුමැතිය ලබාගත් ශ්‍රවනාගාරයක් වෙනුවට වුව ද වෙනත් ශ්‍රවනාගාරයක් ලබා දීමට සිදුවිය හැක.

- අයදුම්පත් අධ්‍යක්ෂ කාර්යාලයෙන් හා ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන සෞඛ්‍ය කළමනාකරණ සහකාර වෙතින් ලබා ගත හැක.
- අනුමත කරගත් අයදුම්පත්
  * නව ශ්‍රවනාගාරය වෙන්කර ගැනීම් අධ්‍යක්ෂ කාර්යාලයේ සෞඛ්‍ය කාර්ය සහයකයින් වෙත
  * පැරණි ශ්‍රවනාගාරය වෙන් කර ගැනීම ප්‍රධාන කාර්යාලයේ සෞඛ්‍ය කාර්ය සහයක ඉන්දික ප්‍රසන්න වෙත
  * ලේබැංකු ශ්‍රවනාගාරය වෙන් කර ගැනීම් ලේ බැංකු හෙද සොයුරු වෙත

  ලබා දිය යුතුය.
- ඔබගේ පහසුව සඳහා ශ්‍රවනාගාර වෙන් කර ගැනීම් පිළිබඳව තොරතුරු රෝහල් වෙබ් අඩවියෙහි පල කිරීමට ද කටයුතු කර තිබේ.

Director
Teaching Hospital,
Badulla.